**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගණුදෙනු කළමණාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍යවන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමණාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානු වලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම ආවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී රු.20,458,790 ක් වටිනා දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනුම් මූල්‍ය ප්‍රකාශන තුල පෙන්නුම් කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයෙහි 2021 වර්ෂයේ මිළ දී ගැනිම් ලෙස වෛද්‍ය උපකරණ රුපියල් 6,260,000 හා පරිගණක උපකරණ 598,790 සටහන් කිරිම අදාළ විෂයභාර නිළධාරිනියගෙන් අතපසු වි ඇති බව නිරික්ෂණය විය. එම ලේඛනය යාවත්කාලින කිරිමට උපදෙස් ලබා දුන් අතර මෝටර් රථ වාහන සඳහා වෙනමම ස්ථාවර වත්කම් ලේඛනයක් ඇති බැවින් අදාළ 13,600,000 වටිනාකම් එම ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර යාවත්කාලීන කර ඇති බව විෂයභාර නිලධාරිනිය විසින් තහවුරු කෙරිනි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කල යුතුය |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදී ක්ෂය වීම්, පොලී ලැබීම් හා කාරක ප්‍රාග්ධන විචලන හා පෙර වර්ෂයේ ගැලපීම් නිවැරදිව ගලපා නොතිබීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.11,346,381 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ආයෝජන තුළින් ඉපයූ පොලිය හා සේවක ණය මඟින් ඉපයූ පොලිය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජිත ක්‍රියාකාරකම් යටතේ (Investment in Fund Deposit) දක්වා ඇත. ආයෝජනය තුළින් ඉපැයූ පොලිය හා සේවක ණය තුළින් ලද පොලිය හා ආයෝජන මුදල වෙනම ම ඉදිරිපත් කර නැතත් එහි අන්තර්ගත වේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කල යුතුය |
| (ආ) | කම්කරු අමාත්‍යාංශය මගින් ආයතනයේ වත්කම් මිලදී ගැනීම සඳහා ලබාදෙන මූලධන ප්‍රදාන, ආයතනය විසින් වත්කම් මිලදී ගැනීම් කටයුතු සඳහා යොදාගනු ලැබේ. එලෙස කම්කරු අමාත්‍යාංශය මගින් ආයතනයේ මූලධන වියදම් සඳහා එකතුව රු.1,124,700 ක් වූ චෙක්පත් දෙකක් ලබාදී තිබුණු අතර ආයතනය විසින් ගිණුම් තැබීමේදී මෙම මූලධන ප්‍රදාන සිය පුනරාවර්තන වියදම් ප්‍රතිපූර්ණය සඳහා යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. තවද මෙම මූලධන ප්‍රදාන, භාණ්ඩාගාර ප්‍රදාන ලෙස 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයටද ගෙන තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අංක 11 ප්‍රකාරව හුවමාරු නොවන ගනුදෙනුවලින් වන අයභාරය හඳුනාගැනීම සඳහා යොදාගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි. 2021 වර්ෂය සඳහා කම්කරු අමාත්‍යාංශයෙන් මූලධන වියදම් සඳහා එකතුව රු.1,964,880 ක් වූ චෙක්පත් දෙකක් ආයතනයට ලැබී | ගිණුම්කරණ ප්‍රමිතින්වලට ප්‍රකාරව ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් මූල්‍ය ප්‍රකාශවල ගැලපිය යුතු වුවත් කම්කරු අමාත්‍යාංශයේ ගිණුම් අංශය විසින් 2018 වර්ෂයේ දි අප වෙත උපදෙස් ලබා දි තිබුණේ බිල්පත් ප්‍රතිපූර්ණය සඳහා අමාත්‍යාංශය වෙත ප්‍රතිපූර්ණය සඳහා ලබා දි තිබුනත් අමාත්‍යාංශයේ ලැබීම් ලෙස ශේෂ පත්‍රයෙහි සටහන් නොකරන ලෙසය. එමෙන්ම 2018 වර්ෂයේ සිට මුදල් ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශය විසින් ලබා දිමේ දි Zero Budget යටතේ මුදල් ගෙවීමට අමාත්‍යාංශය වෙත මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබී ඇති බවය. එම නිසා 2019 සිට මුදල් පදනම මත පමණක් ආයතනය ගිණුම් තැබීම කරන ලදි. එම නිසා 2021 වර්ෂයට අදාළ ප්‍රතිපාදන 2022 වර්ෂයේ ලැබී තිබුණත් එම අගයන් 2021 ලැබීම් ලෙස සටහන් නොකරන ලදි.<br>තවද, මූලධන වියදම් පුනරාවර්ථන ලෙස යොදා නොගෙන ඇති අතර ආයතනය විසින් වියදම් දරා ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කර අමාත්‍යාංශය විසින් ලබා දුන් මුදල් අත් වැරදීමකින් ගිණුම් ශීර්ෂයන් මාරු කර ගිණුම් වලට පිටපත් කර තිබීමයි. එම නිසා 2022 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීමේ දි නිවැරදි මුදල් රිසිට් පත් නිකුත් කරන ලෙස ගිණුම් අංශය වෙත උපදෙස් ලබා දෙන ලදි. | ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයට ගැනීමට කටයුතු කලයුතු බව |

| | | | |
|---|---|---|---|
| | තිබුණු අතර 2022 ජනවාරි මස 4 වන දින මෙම චෙක්පත් දෙකම උපලබ්ධි වී ඇති බව 2022 ජනවාරි මස බැංකු ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී තහවුරු වුණි. එහෙත් ශේෂපත්‍ර දිනට පැවති තත්ත්වයට තවදුරටත් බලපෑම් කල හැකි ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | | |
| (ඇ) | ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව සියලු වත්කම් මිලදී ගන්නා වසර සඳහා ක්ෂය නොකිරීමත්, විකුණන වර්ෂයේදී විකුණන වර්ෂය සඳහාම සම්පූර්ණ ක්ෂය කිරීම සිදුවිය යුතු වුවත් 2021 වර්ෂය තුලදී මිලදී ගන්නා ලද දේපල පිරියත හා උපකරණ රු.20,440,900 ක් වෙනුවෙන් වර්ෂය සඳහාම රු.2,102,180 ක් ක්ෂය කර තිබීම නිසා වර්ෂයේ අතිරික්තය රු.2,102,180 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්කරණ දෝෂය 2022 වර්ෂයේ ගිණුම්වලින් ගැලපීම් කිරීම තුළින් නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි. | ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය නිවැරදිව අනුගමනය කල යුතුය |
| (ඈ) | ආයතනයේ ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි දක්වා ඇති නියමයන්ට අනුව පිළියෙල කර නොතිබුණු අතර එහි රජයේ දායකත්වය හා සමුච්චිත අරමුදල එකම ශේෂයක් ලෙස පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයේ ආරම්භක ශේෂයත් සමඟ සැසඳීමේදී ඉහත පරිදි දක්වා තිබුණු අගයන්වලද රු.6,133,798 ක වෙනසක් නිරීක්ෂණය වුවද එම වෙනසට හේතු විගණනයට පැහැදිලි නොවුණි. | 2021 හිමිකම් ප්‍රකාශනයෙහි ආරම්භක ශේෂය ලෙස රු.202,157,806 ක් ලෙස දක්වනු ලැබුනේ 2020 ගිණුම්වලය. වර්ෂයේ අවසානයේ ශේෂය පැහැදිලිව 2021 ආරම්භක ශේෂය ලෙස ගිණුම් පරිශීලකයන්ට හඳුනා ගැනීමට හැකි වන පරිදි ඉදිරිපත් කර ඇත.<br>එමෙන්ම රු.6,133,798 ක් කිසිසේත් වැඩියෙන් දක්වා නොමැති අතර එය පෙර වර්ෂ ගැලපීම ය. එය මූල්‍ය ප්‍රකාශන පිටු අංක 7 හි 3 වෙනි ජේදය යටතේ (Prior Year Adjustment) ලෙස හෙළිදරව් කර ඇත. | ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 නියමයන්ට අනුකූලව පිළියෙල කිරීමට කටයුතු කල යුතුය |
| (ඉ) | ආයතනය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ ආයෝජන පොලිය රු.12,753,403 ක් වුවද එම ප්‍රමාණය රු.9,218,664 ක් ලෙස | ආයෝජන තුළින් ඉපයූ පොලිය හා සේවක ණය මඟින් ඉපයූ පොලිය මුදල් ප්‍රවාහ ප්‍රකාශය ආයෝජිත ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත. | වර්ෂයට අදාල ආයෝජන පොලිය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය |

රු.3,534,739 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේදී අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 | 2021 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් පොදු 47 ආකෘති පත්‍රය මගින් ඉදිරිපත් කර ඇති ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වර්ග 19 කට අදාල ඒකක 61 ක් සම්බන්ධයෙන් ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 දිනට පෙර සමීක්ෂණ මණ්ඩල නිර්දේශ පරිදි කටයුතු කර නොතිබුණි. | මේ වන විට අදාළ උපකරණ රාජ්‍ය ආයතනයක් වෙත පැවරිම සඳහා ගරු ලේකම්තුමාගේ අනුමැතිය සඳහා යොමු කර ඇති අතර ඒ සඳහා අභ්‍යන්තර විගණන අංශයේ නිර්දේශ ලබාගත් පසු එම කටයුතු නිම කිරිමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය |
| (ආ) 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ 20 වන වගන්තිය | පාරිතෝෂික මුදල් ගණනය සඳහා මූලික හෝ ඒකාබද්ධ වැටුප හෝ වේතනයට ජීවන වියදම් දීමනාව ඇතුලත් කරගත යුතු වුවත් ආයතනය විසින් පාරිතෝෂික ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයන්හි දි පාරිතෝෂිත ගණනයේ දි එ්කාබද්ධ වැටුපට ජීවන වියදම් දීමනාව එකතු කර ගන්නා ලෙස ගණකාධිකාරි වෙත උපදෙස් ලබා දි ඇත. | පාරිතෝෂික ගෙවීම් පනත අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය සහ මාර්ගෝපදේශ අංක 14 | මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කරන ලද 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අදාල උපදෙස් පරිදි සකස් කර නොතිබුණි. | 2021 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව කම්කරු අමාත්‍යාංශයේ උපදෙස් මත නිම කර භාර දි ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2021 හි 12.1 | 2019 හා 2020 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තාව 2022 අප්‍රේල් 21 දිනටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2019 හා 2020 මේ වන විට පාර්ලිමේන්තු සභාගත කිරිම සඳහා ඉදිරිපත් කර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) 2009 අංක 38 දරන ජාතික වෘත්තීය | වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රමිති පිහිටුවීමට | ජාතික ප්‍රමිතින් පිහිටුවීමේ බලධාරියා වනුයේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයයි. එම නිසා එම | පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 3 (1) (ග) උප වගන්තිය | ආයතනය කටයුතු කල යුතු වුවත් 2022 අප්‍රේල් 30 දින වන විටත් එම ප්‍රමිති පිහිටුවා නොතිබුණි. | ආයතනය සමඟ එක්ව ප්‍රමිත පිහිටුවීමට කටයුතු කර ඇත. ඒ සඳහා උදාහරණ ලෙස Standard practice Reparative Protection ප්‍රමිතයන් මේ වන විටත් ප්‍රකාශයට පත්කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.25,122,253 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,057,350 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,064,903 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.